The right *Pathway* to your future!

# FUNDAMENTALS *Of* ICT

TUTE 04


මලිත දිල්ශාන්

MALITHA DILSHAN

# මතක උපාංග - Memory Devices

- පරිඝණකයක් තුළ දත්ත ගබඩා කිරීම සඳහා මතකයක් භාවිතා කරයි.
- මෙහි වර්ග කිහිපයකි. (Types of Memories)

1. **රෙජිස්තර මතකය - Register Memory**
2. **වාරක මතකය / නිහීන මතකය - Cache Memory**
3. **පඨන මාත්‍ර මතකය - Read only Memory (ROM)**
4. **සසම්භාවී පිහිසුම් මතකය - Random Access Memory (RAM)**
5. **ද්විතියික මතකය - Secondary Memory**

## රෙජිස්ටර් මතකය - Register Memory

- නෂ්‍ය මතකයකි. (Volatile)
- ප්‍රොසිසරය තුළ ඇත. (inside the processor)
- භකසනය තුළ ඇති සියලු දත්ත ගබඩා කරයි.
- ප්‍රවේශ වේගය වැඩිම මතකය වේ. (Fastest Memory)
- ධාරිතාවය අඩුම මතකය වේ. (Lowest capacity)
- භෞතික ප්‍රමාණය කුඩාම මතකය වේ.
- රෙජිස්තරය මතකයේ වර්ග කිහිපයකි.

1. *මතක දත්ත රෙජිස්තරය - Memory Data Register (MDR)*
   - භකසනය තුළ දත්ත ගබඩා කරයි.
2. *මතක යොමු රෙජිස්තරය - Memory Address Register (MAR)*
   - භකසනය තුළ යොමු කාරක ගබඩා කරයි.
3. *උපදෙස් මාලා රෙජිස්තරය - Introduction Register (IR)*
   - උපදෙස් හා විධාන ගබඩා කරයි.
4. *ඇකියුම්ලේටර් - Accumilator*
   - AU තුළ සකස් වෙමින් පවතින දත්ත ගබඩා කරයි.

## වාරක මතකය / නිහීන මතකය - Cache Memory

- $L_1$, $L_2$, $L_3$ ලෙස වර්ග 03 කි.
- $L_1$ Processor තුළ ඇති අතර $L_2$ හා $L_3$ Motherboard තුළ ඇත.




- වේගය අඩු වේ.
- ධාරිතාවය වැඩි වේ.

- ප්‍රධාන මතකය හා සකසනය අතර දත්ත හුවමාරුව වේගවත් කරයි.
- නෂ්‍ය මතකයකි.

උදා - : පාන් තැටි උදාහරණය

ගිනි නිවීමට වතුර බාල්දි භාවිතය

## පඨන මාත්‍ර මතකය - Read only Memory (ROM)

- මව් පුවරුව තුළ කුඩා පරිපථයක් ලෙස සකස් කර ඇත. (Silicon හෝ Grearnanion යොදා සකසන ලද IC යක් තුළ මෙය වේ.)
- නෂ්‍ය නොවන මතකයකි. (Non – Volatile)
- ස්ථිරාංග (Firmware) ගබඩා කිරීමට භාවිතා කරයි.
- ස්ථිරාංග වර්ග 02 කි.

1. *BIOS - (Basic Input Output System)*
   - පරිගණකයක් බල ගැන්වීමේ දී (Booting) අවශ්‍ය උපදෙස් ගබඩා කිරීමට භාවිතා කරයි.
   - POST ක්‍රියාවම කරයි. (Power on Self-Test)
2. *CMOS - Complementary Metal Oxide Semiconductors*
   - මූලික උපදෙස් මට්ටම් (Basic setting) දිනය, කාලය ගබඩා කිරීමට භාවිතා කරයි.
   - RAM බලගැන්වීමට CMOS battery ඒකක භාවිතා කරයි.

➢ ROM ප්‍රධාන වර්ග 03 කි.

1. *PROM (Programmable Read Only Memory)*
   - මැකිය නොහැකි මතකයකි.
2. *EPROM (Erasable Read Only Memory)*
   - පාරජම්බුල කිරණ (UU Rays) මගින් මැකිය හැකි කිරණකි.
3. *EEPROM (Electrically Erasable Read Only Memory)*
   - විද්‍යුතය භාවිතයෙන් මැකිය හැකි මතකයකි.

## සසම්භාවී පිහිසුම් මතකය - Random Access Memory (RAM)

➢ පරිගණකයේ ප්‍රධාන මතකයයි. (Main Memory)

➢ ප්‍රසාරණය කර හැකි පරිපථනයක් (Expansion Card) ලෙස මව්පුවරුවට සම්බන්ධ කර ඇත.

➢ නශ්‍ය මතකයකි. (Volatile)

➢ පරිගණකයක් ක්‍රියාත්මකව ඇති විට එහි ක්‍රියාකාරී සියලු දත්තයන් RAM තුළ ගබඩා කරයි.

➢ RAM ආකාර 02 කි.

1. *ස්ථිතික සසම්භාවී පිවිසුම් මතකය (Static RAM / SRAM)*
2. *ගතික සසම්භාවී පිවිසුම් මතකය (Dynamic RAM / DRAM)*

| ***SRAM*** | ***DRAM*** |
|---|---|
| • මතක ධාරිතාවය අඩුය. | • මතක ධාරිතාවය වැඩිය. |
| • භෞතික ප්‍රමාණය අඩුය. | • භෞතික ප්‍රමාණය වැඩිය. |
| • ප්‍රවේශ වේගය වැඩිය. | • ප්‍රවේශ වේගය අඩුය. |
| • Auto Refreshing | • Manual Refreshing |
| • මිල සාපේක්ෂව වැඩිය. | • මිල සාපේක්ෂව අඩුය. |
| • රෙජිස්ටාර් හා චාරක මතක සඳහා භාවිතා කරයි. | • ප්‍රධාන මතකය සඳහා භාවිතා කරයි. |

➢ DRAM වර්ග කිහිපයකි.

1. SDRAM - (Synchronize Dynamic RAM)
2. RAM BUS
3. DDRRAM - (Double Data Rating RAM) (DDR, DDR II, DDR III)

***RAM එක නොමැතිව හෝ වැඩ නැතුව පරිගණකය Start කර පසු කුමක් සිදු වේද?***

## <u>නෂ්‍ය මතකය - Volatile Memories</u>

- විදුලි බලය නොමැති විට දත්ත මැකී යන මතකයන් වේ.

*උදා* -: රෙජිස්ටර් මතකය
වාරක මතකය
RAM

## <u>නෂ්‍ය නොවන මතකය - Non Volatile Memories</u>

- විදුලි බලය නොමැති විට දත්ත මැකී නොයන මතක

*උදා* -: ROM
ද්විතියික මතකය

## ද්විතියික මතකය - Secondary Memory / Storage

- මෙය නෂ්‍ය නොවන මතකයකි. (Non Volatile)
- පරිගණක පද්ධතියක භාහිරව හෝ අභ්‍යන්තරිකව සම්බන්ධ කර දත්ත ගබඩා කිරීමට භාවිතා කරයි.
- භාවිතා කරනු ලබන තාක්ෂණය අනුව මෙහි ප්‍රධාන වර්ග 03 කි.

1. චුම්භක උපාංග - Magnetic Devices
2. ප්‍රකාශ උපාංග - Optical Devices
3. ඝණ අවස්ථාවේ උපාංග - Solid state Devices

- විශාල දත්ත ප්‍රමාණයක් Save කිරීමට හැකියාව ඇත.
- Portable (තැනින් තැනට ගෙන යා හැක.)

## <u>*චුම්භක උපාංග - Magnetic Devices*</u>

- දත්ත ගබඩා කිරීම සඳහා චුම්භක තාක්ෂණය භාවිතා කරයි. (Magnetic Technology)
- එනම් මෙහි දත්ත ගබඩා කිරීම සඳහා උත්තර හා දක්ෂිණ ධ්‍රැවයන් භාවිතා කරනු ලබයි. (N – S)
- මේ දත්ත කියවීමට චුම්භක සංවේදී දිශා (Header) භාවිතා කරනු ලබයි. (Magnetic Sensors)

*උදා* -: චුම්භක දෘඩ තැටි (Magnetic Hard Disk)
චුම්භක පටි (Magnetic Tape)
චුම්භක තීරු (Magnetic Strip)
Floppy Disk

## ***ප්‍රකාශ උපාංග - Optical Devices***

- මෙහි දත්ත ගබඩා කිරීම සඳහා ප්‍රකාශ තාක්ෂණය භාවිතා කරයි. (Light)
- එනම් මෙම උපාංගයන් හෝ දත්ත ගබඩා කිරීමට සිදුරු හා ගොඩැලි (Pits and Bumps) තාක්ෂණය භාවිතා කරයි.
- මෙම උපාංගයන්ගේ දත්ත කියවීමට ආලෝක කදම්භ හෝ ලේසර් කදම්භ භාවිතා කරයි. (Light rays – Laser)

*උදා* -: Compack Disk (CD) 700 MB Ap
Digital Versatile Disk (DVD) 4.7 GB Ap
Blue Ray Disk 50 GB Ap

## **ඝණ අවස්ථාවේ උපාංග - Solid state Devices**

- දත්ත ගබඩා කිරීමට අර්ධ සන්නායක තාක්ෂණය භාවිතා කරයි. (Semi-Conductors)
- මේ සඳහා චලනය වන අංශු භාවිතා කරනු ලබයි.
- මෙම උපාංගයන් වල අඩු ඝණත්වයක් තුළ වැඩි දත්ත ප්‍රමාණයක් ගබඩා කල හැක. (High capacity in low density)

*උදා* -: සැනලි මතකය - Flash Memory
ශුද්‍ර චිපයන් - Micro Chip
SD SDHF

## **මතක ධූරාවලිය - Memory Hierarchy**

- එක් එක් මතකයන්ගේ ගති ලක්ෂණ මෙම ධූරාවලිය මඟින් නිරූපණය කරයි.

- ප්‍රවේශ වේගය වැඩිවේ. (Access Speed)
- Bit එකක් සඳහා පිරිවැය වැඩිවේ.




- ධාරිතාවය වැඩිවේ.
- මතක ඝණත්වය වැඩිවේ. (Density)
- භෞතික ප්‍රමාණය වැඩි

➢ ද්විතියික මතකයන්ගේ වේගයන් පහත පරිදි වෙනස් වේ.

- ප්‍රවේශ වේගය අඩු වේ.

ඝණ අවස්ථාවේ උපාංග

↓

චුම්භක දෘඩ තැටි (Magnetic Hard Disk)

↓

ප්‍රකාශ උපාංග

↓

චුම්භක පටි (Magnetic Tape)

## මතක අතර ප්‍රධාන වෙනස්කම්

### *01. රෙජිස්තර මතකය හා ද්විතියික මතකය*

| රෙජිස්තර මතකය | ද්විතියික මතකය |
|---|---|
| • නෂ්‍ය මතකයකි. | • නෂ්‍ය නොවන මතකයකි. |
| • සකසනය තුළ ඇති සියලුම දත්ත ගබඩා කරයි. | • පරිගණක පද්ධතියට බාහිරව හෝ අභ්‍යන්තරිකය භාවිතා කරනු ලබන දත්ත ගබඩා කරයි. |
| • ප්‍රවේශ වේගය වැඩිම මතකය වේ. | • ප්‍රවේශ වේගය සාපේක්ෂව අඩුය. |
| • ධාරිතාවය අඩුය. | • ධාරිතාවය වැඩිය. |
| • භෞතික ප්‍රමාණය අඩුය. | • භෞතික ප්‍රමාණය වැඩිය. |
| • මතක ඝණත්වය අඩුය. | • මතක ඝණත්වය වැඩිය. |
| • Bit 1 ක් සඳහා පිරිවැය වැඩිය. | • Bit 1 ක් සඳහා පිරිවැය අඩුය. |

### *02. රෙජිස්තර හා RAM*

| රෙජිස්තරය | RAM |
|---|---|
| • වේගය වැඩිය. | • වේගය අඩුය. |
| • ධාරිතාවය අඩුය. | • ධාරිතාවය වැඩිය. |
| • මිල වැඩිය. | • මිල සාපේක්ෂව අඩුය. |
| • ප්‍රවේශ වේගය වැඩිය. | • ප්‍රවේශ වේගය අඩුය. |
| • භෞතික ප්‍රමාණය අඩුය. | • භෞතික ප්‍රමාණය වැඩිය. |

## *03. දෘඪ තැටිය හා සංයුක්ත තැටිය*

| දෘඪ තැටිය | සංයුක්ත තැටිය |
|---|---|
| • ධාරිතාවය වැඩිය. | • ධාරිතාවය අඩුය. |
| • වේගවත් බව වැඩිය. | • වේගවත් බව අඩුය. |
| • මතක ඝණත්වය වැඩිය. | • මතක ඝණත්වය අඩුය. |

## *04. CD හා DVD*

| CD | DVD |
|---|---|
| • ධාරිතාවය අඩුය. | • ධාරිතාවය වැඩිය. |
| • දත්ත ගබඩා කිරීමට එක් ස්ථරයක් භාවිතා කරයි. | • දත්ත ගබඩා කිරීමට ස්ථර 2ක් භාවිතා කරයි. |
| • මිල අඩුය. | • මිල වැඩිය. |

➢ මතක උපාංගයන්ගේ වේගය මැනීම සඳහා විවිධ ඒකක භාවිතා කරයි.

1. Hertz (Hz) (තප්පරයකට වට ගණ - round per second)
    - Register
    - Cache
    - RAM

2. Rounds per Minutes – RPM (මිනිත්තුවට වට)
    - Hard Disk (7200 RPM)
    - CD
    - DVD
    - Blue Ray

3. Bit per seconds (bps) - (තත්පරයට Bit)
    - දත්ත සම්ප්‍රේෂණ වේගය මැනීමට භාවිතා කරයි.
    - Flash Memory

- මතක උපාංගයන් හි ධාරිතාවය මැනීම සඳහා ඒකකය Byte ලෙස භාවිතා කරයි.

| | | |
|---|---|---|
| 1 Bit | = | 1 or 0 |
| 1 Rubble | = | 4 Bit |
| 1 Byte | = | 8 Bit |
| 1 KB | = | $2^{10}$ Byte (1024) |
| 1 MB | = | $2^{10}$ Kilo byte |
| 1 GB | = | $2^{10}$ Mega Byte |
| 1 TB | = | $2^{10}$ Giga Byte |

- මතක උපාංගයන් කිහිපයක ධාරිතාවයන් ආසන්න වශයෙන් පහත පරිදි වේ.

1. Register ⟶ 32/64 bit
2. Cache ⟶ $L_1$ KB
   $L_2$, $L_3$ } MB
3. ROM ⟶ MB
4. RAM ⟶ GB
5. Secondary Storage
   - ✓ CD ⟶ 700 MB
   - ✓ DVD ⟶ 4.8 GB
   - ✓ Blue Ray ⟶ 25 – 100 GB
   - ✓ Hard Disk ⟶ GB / TB
   - ✓ Flap Memory ⟶ GB / TB
   - ✓ Micro Chip ⟶ GB / TB
   - ✓ Floppy Disk ⟶ 1.44 MB




මලිත දිල්ශාන්

BSc Physics and Electronics (Kelaniya) , Master in Information Technology (Kelaniya)
Ass. Lecturer - University of Kelaniya | Lecturer (Kelani Institute of HIgher Education) ,
Co-Founder | COO Prodesigner.lk PVT LTD ,

**maitha.uok@gmail.com**

071-7183318 (Mobile) 078-9660220 (Whatsapp)